**මාතර මහා නගර සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**--------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 09 දින නගරාධිපති ඇතුළු සභිකවරුන්ට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.804,233 ක් වූ බෙල් යන්ත්‍රයෙහි වටිනාකම සහ පරිගණක හා උපාංග 06 ක වටිනාකම තක්සේරු කර, ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සභා අරමුදල් සහ විවිධ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ නිමකර තිබූ කර්මාන්ත 06 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන රු.2,723,314 ක් වැඩියෙන් ඇතිකර තිබුණි.

(ඇ) විවිධ ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ නිමකර තිබූ කර්මාන්ත 02 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන රු.486,293 ක් වැඩියෙන් හා තවත් කර්මාන්ත 02ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන රු.1,567,144 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ නිම කර තිබූ කර්මාන්ත 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.17,817,976 ක මුදල ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සෘජු ශ්‍රමික පදනම මත ඉටුකර තිබූ රු.1,136,291 ක් වූ කර්මාන්ත 05 ක් සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.800,400 ක් වූ විගණන ගාස්තු සහ සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට යැවිය යුතු එකතුව රු.44,690,057 ක් වූ දායක මුදල් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවා තිබූ රු.1,073,675 ක ණය වාරිකයන්හි ඇතුලත් රු.817,221 ක ණය පොලී වටිනාකම ණය මුදලින් අඩුකර දක්වා තිබුණි.

(එ) ස්ථාවර වත්කම්, මෙවලම් හා උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතුව රු.2,519,654 ක්වූ ද්‍රව්‍ය නිකුත් කිරීම් වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයට අදාලව එකතු කළ අගය මත ලැබිය යුතු රු.1,984,740 ක් වූ බදු මුදල් හරස් සටහන් මගින් ගැලපීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු සියළු බදු මුදල් ගෙවා තිබුණද රු.1,782,386 ක මුදලක් ගෙවිය යුතු ලෙස විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර තිබූ ස්ථාවර වත්කම් අයිතම 37 කට අදාළ භාණ්ඩ හඳුනාගෙන වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 60,922,297ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.30,236,500 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.278,891,530 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ එකතුව රු.8,378,918 ක් වූ ශේෂ 18 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.119,776,120 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ එකතුව රු.93,378,501 ක් වූ ශේෂ 18 ක් ඇතුළත් වී තිබුණි.

(ii) ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයේ මැතිවරණ අත්තිකාරම්වල ඇතුළත් ගෙවිය යුතු වියදම්වලට අදාළ රු.852,341 ක් වූ මුදල නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.198,524,830 ක්වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

#### 1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ** වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මහා නගර ආඥා පනතේ 254 (අ) වගන්තිය | සභාවට අයවිය යුතු සියළු බදු, දඩ මුදල්, දඩුවමක් වශයෙන් වූ ගෙවීම් අයකරගෙන එම මුදල් මහා නගර සභාවේ අරමුදලට බැර කිරීම සඳහා සියළු පියවර ගත යුතු වුවද, ඉකුත් වර්ෂය අවසානයටවූ රු.394,501,983 ක හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xi පරිච්ඡේදයේ 21:11 හා 22:04 ඡේද | සභාවේ සේවයේ නියුක්ත නිලධාරීන්/ සේවකයින් 122 දෙනෙකුගේ වැටුප් රහිත හා අඩ වැටුප් රහිත නිවාඩු පිළිබඳ මාසික වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 102 සිට 110 දක්වා | නැතිවීම්, හානිවීම් පිළිබඳව කටයුතු කර ඊට අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 1645 හා 1646 | 2018 ජුනි 13 වන විටත් මහා නගර සභාවේ වාහන 81 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් මාසික සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගනක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් 2003 වර්ෂයේ සිට පවත්වා නොතිබුණි. |
| (ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| (i) 2014 දෙසැම්බර් 30 දිනැති 2014/3(i) චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට අදාළ නොවන අයුරින් ප්‍රජා සංවර්ධන නිලධාරීන් සඳහා රු.35,000 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ii) 2015ජුලි 10 දිනැති අංක 2/2015 දරන චක්‍රලේඛය | භාවිතයෙන් ඉවත් කර ඇති වාහන අපහරණය සඳහා කටයුතු කළ යුතු වුවද, භාවිතයෙන් ඉවත් කර තිබූ රු.11,278,000 ක් වටිනා වාහන 09 ට අදාළව 2018 ජුනි 02 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2016 දෙසැ. 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම වාහනයක් සම්බන්ධයෙන්ම ඉන්ධන දහන පරීක්ෂාව සිදුකල යුතු වුවද, මහා නගර සභාව සතු වාහන 92 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.157,500,775ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.116,367,859 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

----------------

ජංගම වත්කම් යටතේ පැහැරගත් මුදල් ගිණුමේ ශේෂය ඇතුළත් කර දැක්වීම නිසා, ජංගම වත්කම් තුළ රු.169,360 ක ව්‍යාජ වත්කම් ඇතුළත්වී තිබූ අතර අදාළ මුදල පැහැර ගැනීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

------------------------

### 2.3.1 ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 37,073,065 | 38,595,208 | 35,948,877 | 60,368,667 | 42,000,100 | 38,286,323 | 39,997,350 | 57,722,336 |
| කුලී | 27,671,963 | 28,038,858 | 26,065,886 | 63,668,754 | 18,762,300 | 25,509,278 | 20,729,916 | 61,695,782 |
| බලපත්‍ර ගාස්තු | 18,802,100 | 27,103,901 | 24,440,033 | 14,151,953 | 15,310,100 | 17,937,208 | 18,002,208 | 11,488,085 |
| වෙනත් ආදායම් | 142,574,400 | 169,049,081 | 103,044,750 | 256,312,609 | 178,914,600 | 145,521,560 | 78,606,299 | 190,308,278 |
| එකතුව | 226,121,528 | 262,787,048 | 189,499,546 | 394,501,983 | 254,987,100 | 227,254,369 | 157,335,773 | 321,214,481 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.226,121,528 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.321,214,481 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.262,787,048 ක් සමඟ රු.584,001,528 ක් අයවීමට තිබූ අතර මුළු අයවීම් රු.189,499,546 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.394,501,983ක් විය. හිඟ ආදායම්වලින් අයවීම් අඩු මට්ටමක පැවති අතර වරෙන්තු ගාස්තු හා දඩවලින්, නඩු දමා අයකල යුතු ශේෂය වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂ වෙනුවෙන් හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන්වූ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 වරිපනම් හා බදු**

------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) **වරිපනම්**

--------

ආරම්භක හිඟය රු.57,177,599 ක් වූ අතර, රු.34,017,144 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.91,194,743 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.31,255,650 ක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.59,939,093ක් තරම් මෙම හිඟ මුදලෙහි රු.10,000 ට වැඩි හිඟ ශේෂ ඇති වරිපනම් ඒකක 759 කින් රු.26,129,098ක මුදලක් හිඟව පැවතුණි.

(ආ) **විනෝද බදු**

-------------

ආරම්ක හිඟ විනෝද බදු ශේෂය රු.544,737 ක් වූ අතර, රු.4,578,063 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,122,800 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,693,226 ක් වූයෙන් වර්ෂය අවසානයට රු.429,574 ක් හිඟව පැවතුණි.

**2.3.4 කුලී**

-----

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ආරම්භක හිඟය රු.61,695,782ක් වූ අතර, රු.28,038,858 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.89,734,640 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.26,065,886 ක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.63,668,754 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ii) සභාව සතු කුලියට දී ඇති ආයතන 19 කින් සහ බිම්බදු ස්ථාන 21 කින් කුලී ලෙස අයවිය යුතු රු.51,759,550 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මින් කොටුවේගොඩ කඩකාමර 68 සඳහා ගිවිසුම් අත්සන් කර නොතිබූ බැවින් හිඟ මුදල් අයකර ගැනීමේ අවදානමක් පැවතුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

-----------------

**(අ) වෙළඳ බලපත්‍ර**

-----------------

ආරම්භක හිඟය රු.5,938,895 ක් වූ අතර, රු.9,234,970 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.15,173,865 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.8,692,170 ක් වීම නිසා, පාලන ගිණුම සහ නඩු පවරා ඇති වෙළඳ බලපත්‍ර ගාස්තු ගිණුම අනුව වර්ෂය අවසානයට හිඟය රු.6,481,695 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

**(ආ) දැන්වීම් පුවරු ගාස්තු**

------------------------

ආරම්භක හිඟය රු.5,549,190 ක් වූ අතර, රු.16,565,251 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.22,114,441 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.14,444,183 ක් වීම නිසා, වර්ෂය අවසානයට හිඟය රු.7,670,258 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.308,840 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.253,033,985 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන, සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

--------------

(i) මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන සහ අනු කාරණා 03 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ii) පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් විධිමත් පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි.

- මාර්ගවලට අප ජලය බැහැර කිරීම
- මත්ස්‍ය වෙළඳාම තැනින් තැන සිදු කිරීම

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

අතුරු ව්‍යවස්ථා මගින් පනවා ගෙන තිබූ කර්තව්‍යයන් මත 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත, සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.29,323,135 ක් වූ සංවර්ධන යෝජනා 21 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

----------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යන් 06 ක් ඉටු කිරීම සඳහා රු.695,738 ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන නොතිබුණි.

**(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම**

--------------------------------------------------

දකුණු පළාත් සභා සංවර්ධන සැළැස්ම 2017 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සහ සභා අරමුදල් යටතේ කුමාරතුංග මුණිදාස පුස්තකාලය විද්‍යුත් පුස්තකාලයක් බවට පත් කිරීම සඳහා වෙන් කළ මුදලින් රු.10,025,000 ක පරිගණක 07 ක් පමණක් මිලදී

ගෙන ඉන් දෙකක් වෙනත් අංශ වෙත ලබාදී තිබූ අතර, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ අත් කර ගත නොහැකි වී තිබුණි.

**(ඉ) අතහැර දැමූ කර්තව්‍යන්**

**-------------------------**

කසළ කළමනාකරණය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රතිපාදන මත ජීව වායු ඒකකය ඉදිකිරීම වෙනුවෙන් ඉකුත් වර්ෂය අවසාන වන විට රු.6,435,644 ක් වැයකර තිබූ නමුත්, 2018 ජුනි 12 දින වනවිට අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන අත්හැර දමා තිබුණි.

**(ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

ආසන්න වර්ෂ 05 තුල කසළ එකතු කිරීම වෙනුවෙන් රු.442,188,985 ක් වැය කර තිබුණද, එකතු කළ කසළවලින් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ සියයට 90 ක් අවිධිමත්ව මුදාහැර තිබීම නිසා කසළ කන්දක් නිර්මාණය වී තිබුණි. අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා මහජන පීඩාවන් සිදුවන බැවින් පොලීසිය විසින් අධිකරණයේ නඩු පැවරීමද සිදුකර තිබුණි. එහෙත් කසළ කළමනාකරණය සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 17 හා අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ 05 ඡේදයට අනුකූල නොවන අයුරින් භාවිතය වෙනස් කර තිබූ වාහන නැවතුම් ස්ථාන 29 ක් වෙනුවෙන් අයවිය යුතු රු.14,500,000 ක මුදලක් අයකර නොතිබුණි.

(ආ) නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 27 හා 1597/08 දරන ගැසට් පත්‍රයේ **6** (ii) ඡේදයට අනුකූල නොවන අයුරින් නගර සභා අනුමැතියකින් තොරව ඉදිකර තිබූ කොටුව නීතිඥ කාර්යාල සංකීර්ණය වෙනුවෙන් රු.1,250,600 ක් හා සැළසුමට අනුකූල නොවන ලෙස ඉදිකර තිබූ ගොඩනැගිලි අයදුම්පත් 02 කට අදාළව ගොඩනැගිලි සම්බන්ධයෙන් අයකල යුතු රු.7,996,000ක මුදලක් අයකර නොතිබුණි.

(ඇ) නගර සභා පාලනයට අයත් වර්ග මීටර් 4,000 ට වඩා අඩුවෙන් ඉදිකර තිබූ අනවසර ඉදිකිරීමක් වෙනුවෙන් දඩ මුදල් අය කිරිම හා විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සිදුකර නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ආසන්න වර්ෂ 03 ක් මාතර මහා නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය විසින් ගිනි ආරක්ෂණ බලපත්‍ර 166 ක් නිකුත් කර තිබූ අතර, 2015 හා 2016 වර්ෂයට අදාළව නිකුත් කර තිබූ ගිනි ආරක්ෂණ බලපත්‍ර 107 ක් 2017 වර්ෂය සඳහා අළුත් කර නොතිබීම පිළිබඳව කටයුතු කර නොතිබුණි.

(ඉ) පොල්හේන සාගර සෙවන පොදු පහසුකම් ස්ථානයේ පොදු වැසිකිලිය අළුත්වැඩියා කිරීම ප්‍රමාද වීම නිසා, 2017 වර්ෂයේ රථගාල බදුදීමට නොහැකි වීමෙන් රු.502,063 ක පාඩුවක් සිදුව තිබුණි. සභාව සතු රථගාලේ ගාස්තු බාහිර පාර්ශව විසින් අය කර තිබූ අතර සභාව

මේ සඳහා විධිමත් වැඩපිළිවෙලකට එළඹ නොතිබුණි. 2016 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.277,833 ක මුදලද ලැබී නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා

------------------------------------

(i) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන අයුරින් සේවකයින් 104 දෙනෙකු බඳවාගෙන වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.30,486,713 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ii) අතිරික්ත සේවක සංඛ්‍යාවක් සිටියදී කම්කරුවන් විධිමත්ව යෙදවීම මෙන්ම රාජකාරී අධීක්ෂණය නිසි පරිදි සිදුකර නොතිබුණි.

(ආ) වැඩ බැලීමේ පත්වීම්

----------------------

මාතර මහා නගර සභාවේ ගිනි නිවීමේ ඒකකයේ ස්ථානභාර නිලධාරී තනතුර සඳහා 2012 අගෝස්තු 02 දින සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.1,012,500 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) සේවක ණය

---------------

සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ 10කට පෙර විශ්‍රාම ගිය, මියගිය, සේවය අතහැරගිය, ස්ථානමාරුවී ගිය සේවකයින්ගේ ආපදාණය, උත්සව අත්තිකාරම්, විශේෂ ණය, වාහන ණය සහ ගංවතුර අත්තිකාරම් වෙනුවෙන් ලබාදුන් ණය මුදල්වලින් රු.459,687 ක මුදලක් අයවීමට තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නිවාස යෝජනා ක්‍රම 06 කට අයත් දේපළ 154 කින් වසර 03 සිට වසර 33 ක කාලයට අදාලව හිඟ බිම් බදු මුදල් අයනොවී තිබූ අතර මෙම බදුකරුවන් සමඟ ගිවිසුම් අත්සන් කර නොතිබුණි. සභාව අවසරයකින් තොරව දේපල විකිණීම, හුවමාරු කිරීම, සිදුකර ඇති නමුත් සභාව ඒ සඳහා අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2014 ඔක්තෝබර් 15 දිනැති ප්‍රධාන ලේකම්ගේ (මුදල්) චක්‍රලේඛ 03/2015 පරිදි ඇස්තමේන්තු වටිනාකම වූ රු.2,225,390 ක් වූ කර්මාන්තයක් වෙනුවෙන් ද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය ඇස්තමේන්තු සකස් කර නොතිබූ අතර ද්‍රව්‍ය මිලදී ගැනීමට පමණක් ඇස්තමේන්තුකර තිබුණි. තවද මෙම පදනම මත ඉටුකිරිමට සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(i) ඇස්තමේන්තු අගය රු.2,114,382 ක වටිනාකමට ඉටුකල කර්මාන්ත වෙනුවෙන් වියදම් වාර්තා සකස් කර නොතිබුණි.

(ii) සෘජු ශ්‍රම පදනම මත ඉටු කළ කර්මාන්ත සඳහා ද්‍රව්‍ය අයිතම 11 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.4,066,830 ක් වැය කර ඉන් රු.3,783,162 ක ද්‍රව්‍ය නිකුත් කර තිබුණද, රු.1,905,929 ක ද්‍රව්‍ය කුමන කර්මාන්තවලට නිකුත් කර තිබුනේද යන්න පිළිබඳව වාර්තා සකස් කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

**3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

---------------------------------------------

නගර සභාව සතු දේපල 6 ක් අනවසරයෙන් පෞද්ගලික නිවාස ගොඩනගා ගැනීමට හා පරිභෝජනයට යොදා ගෙන තිබුණි.

**3.5.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් හා ගොඩනැගිලි

------------------------

මාර්කට් පාරේ අබලන්ව තිබූ වරිපනම් අංක 81 ප්‍රජාශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ඵලදායී කාර්යයකට යොදවා ගෙන නොතිබුණි.

(ආ) වාහන හා යන්ත්‍රසූත්‍ර

----------------------

රු.26,192,856 ක් වටිනා වාහන හා යන්ත්‍ර 05 ක් නිශ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි.

**3.5.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය**

----------------------------------------

2016 වර්ෂයේ මහා නගර සභාවේ භාණ්ඩ සමීක්ෂණය මගින් ඌණතා ලෙස දක්වා තිබූ අංශ 09 කට අයත් භාණ්ඩ ඒකක 282 ක් 2017 වර්ෂයේ භාණ්ඩවල ඇතුළත් බව දක්වා තිබුණි. 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා දින වැටුප් වෙනුවෙන් මිනිස් දින 768 ක් හා අතිකාල පැය 200 ක් වෙනුවෙන් රු.559,219 ක් ගෙවා තිබුණද භාණ්ඩ සමීක්ෂණය විධිමත්ව සිදුකර නොතිබූ අතර, භාණ්ඩ සමීක්ෂණය සඳහා ගෙවන මුදල ද ඵල රහිත වී තිබුණි.

**3.5.4 වාහන උපයෝජනය**

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව තිබූ වාහන 42 ක් සඳහා 2017 වර්ෂය තුළ රු.7,901,059 ක ඉන්ධන වියදම් දරා තිබුණ අතර, මෙම වාහන 42 න් වාහන 21 ක මයිලෝ මීටර කියවීම අනුව ඉන්ධන තුලනය නොකර ඩීසල් ලීටර් 27,017ක් හා පෙට්‍රල් ලීටර් 1,816 ක් නිකුත් කිරීම වෙනුවෙන් රු. 2,779,087 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) බැකෝ ලෝඩරය අළුත්වැඩියා කිරීම හා ඉන්ධන වියදම් වෙනුවෙන් රු.2,996,260 ක් වැයකර තිබුණි. වාහනය ධාවනය කල කාලය විධිමත්ව සටහන් කර නොතිබූ අතර

වාහනය වැඩකල කාලය සහ සභාවට යාමට ඒමට ගතවූ කාලයට වඩා අමතර පැය ගණනක් කිසිඳු කාර්යයකට යොදවා ගෙන නොතිබුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014, 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ගෙන්වා ගෙන තිබූ නිලධාරීන් සතියේ දිනවල වැඩ කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තියට අනුකූල නොවන අයුරින් රු.509,219 ක මුදලක් නිවාඩු දින දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඩෙංගු රෝගය පැතිරීම වැළැක්වීමට ධූමායනය කිරීම වෙනුවෙන් මහා නගර සභාව විසින් ඉන්ධන සඳහා රු.1,539,096 ක මුදලක් වැය කර තිබුණද නිශ්චිත ස්ථානයක් හෝ රෝගීන් සිටින ස්ථානයක් නොදක්වා ධූමායනය සිදු කිරීම සඳහා වැය කල මුදල රු.1,215,882 ක් විය. ඉන් රු.311,140ක මුදලින් ධූමායනය කළ කිසිදු ස්ථානයක් සඳහන් කර නොතිබුණි.

## 3.7 හඳුනාගත් පාඩු

------------------

මාතර බස් නැවතුම්පොළ පොදු වැසිකිලිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය නියමිත දිනට ඉටු නොකිරීම හා කර්මාන්තය නිම කිරීමෙන් පසු නියමිත පරිදි බදුකරුට භාර නොදීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු. 689,664 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

## 3.8 දෘශ්‍ය අක්‍රමිකතා

------------------

ගිනි නිවීමේ ඒකකයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් මාතර මහා නගර සභාවේ කිසිඳු අනුමැතියකින් තොරව රාජකාරි වේලාව සහ රාජකාරි වේලාවෙන් බැහැරව වෙනත් ආයතන වෙත ගිනි නිවීමේ පුහුණු වැඩ සටහන් පවත්වා රු.412,500 ක ආදායමක් උපයාගෙන තිබුණි. එම ආයතන සඳහා සහතික නිකුත් කිරීමට මහා නගර සභාවේ ලිපි ශීර්ෂය හා ගිනි නිවීමේ ඒකකයේ සුභසාධන සංගමයේ ලිපි ශීර්ෂ භාවිතා කර තිබුණි. අදාළ කාර්යය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

## 3.9 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

මාතර වල්ගම උතුර කිංස් ගාර්ඩන් පාර හා කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය රු.992,448 ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර රු.295,432 ක් වටිනා ගිවිසගත් වැඩකොටස් 07 ක් ඉටුකර නොතිබුණි. කාණු පද්ධතිය ඉදිකිරීමට අදාල දළ සැලැස්ම හා මිනුම්ගත් ආකාරය ඇස්තමේන්තු සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 07 ක එකතුව රු.76,303,081 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 05 සිට 61 දක්වා පරාසයක පැවතුණි.

(ආ) එක් වියදම් විෂයයක රු.990,251 ක අහිතකර විචලනයක් නිරීක්ෂණය වූ අතර, එම වටිනාකම සියයට 48 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 37,238,737 ක් වූ අතර, එම වටිනාකම සියයට 03 සිට 15 දක්වා පරාසයක පැවතුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

මහා නගර සභාවේ ගනුදෙනු හා මෙහෙයුම් ප්‍රමාණය අනුව අභ්‍යන්තර විගණන ඒකකයට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කිරීම පිළිබඳව අවධානය යොමුවී නොතිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධාන සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 නොවිසඳී ඇති නිරීක්ෂණ

---------------------------

(අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 දරන චක්‍රලේඛයේ 8.1 වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කර මුද්දර ගාස්තු ආදායම් එකතු කිරීම වෙනුවෙන් මහා නගර සභාවේ නිලධාරීන් 11 දෙනෙකුට රු.1,365,965 ක කොමිස් මුදල් ගෙවා තිබීම.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට හිඟ විනෝද බදු මුදල අය නොකිරීම

(ඇ) නොතාරිස් කඩ කාමරවලින් කුළී මුදල් අය නොකිරීම

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) වාහන පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) ගිණුම්කරණය

(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඊ) අයවැය පාලනය

(උ) ණයගැති හා ණයහිමි පාලනය

(ඌ) කොන්ත්‍රාත් පාලනය